# වැලිගම නගර සභාව

## ලංසු සඳහා ආරාධනයයි.

**සී.සී.ටී.වී.කැමරා පද්ධති සපයාගැනීම, සවිකිරීම, පවත්වාගැනීම හා නඩත්තුව**

වැලිගම නගර සභා පරිශ්‍රය සහ කප්පරතොට කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ආවරණය වන පරිදි සී.සී.ටී.වී.කැමරා පද්ධති සපයාගැනීම, සවිකිරීම, පවත්වාගැනීම හා නඩත්තුව සඳහා සුදුසුකම්ලත් හා සුදුසුකම් සපුරා ඇති ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

පහත උපලේඛනයේ සඳහන් ලංසු පෝරම ගාස්තු ගෙවා අප කාර්යාලයෙන් ලබාගන්නා ලද ලංසු පෝරම මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුය.ලංසු ඉදිරිපත් කිරීමේ දී උපලේඛනයේ සඳහන් ලංසු සුරක්ෂණයට අදාළ ගාස්තුව අප කාර්යාලය වෙත මුදලින් ගෙවා ලබාගන්නා ලද රිසිට්පත හෝ ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් ලබාගත් ලංසු සුරක්ෂණයක් සමග ලංසු ඉදිරිපත් කළ යුතුය.

**2026.07.30** දින **පෙ.ව.10.00** දක්වා ලංසු පෝරම නිකුත් කරනු ලැබේ.ලංසුපත් භාරගැනිම **2026.07.30** දින **ප.ව.1.00** දක්වා පමණි.ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ.ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුට හෝ ලංසුකරුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකි ය.

පහත එක් එක් කාරණය සඳහා ඉදිරිපත් කරනු ලබන ලංසුපත් පිටපත් 02කින් යුතුව සකස් කර ''මුල් පිටපත'' හා ''අනු පිටපත'' ලෙස සඳහන් ලිපි කවර 02ක වෙන වෙන ම බහා එම ලිපි කවර දෙක ලංසු ඉදිරිපත් කරනු ලබන කවරයේ බහා එම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ ඉදිරිපත් කරන කරුණට අදාළව **'' වැලිගම නගර සභා පරිශ්‍රයට සී.සී.ටී.වී.කැමරා පද්ධති සඳහා මිල ගණන් ''** සහ **'' කප්පරතොට කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයට සී.සී.ටී.වී.කැමරා පද්ධති සඳහා මිල ගණන් ''**ලෙස වෙන වෙන ම කවරවල සඳහන් කර **''සභාපති, නගර සභාව, හෙට්ටිවීදිය, වැලිගම ''** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අප කාර්යාලයේ රැස්වීම් ශාලාවේ ස්ථානගත කර තිබෙන ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදුකළ යුතුය.

ඕනෑම ලංසුවක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය වැලිගම නගර සභාව සතුය.ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.වැඩි විස්තර දුරකථන අංක 041-2250275 අමතා ගිණුම් අංශය මගින් දැනගත හැකිය.

| විස්තරය | නැවත නොගෙවන ලංසු පෝරම ගාස්තුව (ශ්‍රී.ලං.රු.) | ලංසු වලංගු කාලය | ලංසු සුරක්ෂණය (ශ්‍රී.ලං.රු.) | ලංසු සුරක්ෂණය වලංගු කාලය |
|---|---|---|---|---|
| වැලිගම නගර සභා පරිශ්‍රය සඳහා සී.සී.ටී.වී.කැමරා පද්ධති සපයාගැනීම, සවිකිරීම, පවත්වාගැනීම හා නඩත්තුව | 1,000.00 | 2026.07.30 දින සිට 2026.09.16 දින දක්වා | 20,000.00 | 2026.07.30 දින සිට 2026.10.14 දින දක්වා |
| කප්පරතොට කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය සඳහා සී.සී.ටී.වී.කැමරා පද්ධති සපයාගැනීම, සවිකිරීම, පවත්වාගැනීම හා නඩත්තුව | 1,000.00 | 2026.07.30 දින සිට 2026.09.16 දින දක්වා | 20,000.00 | 2026.07.30 දින සිට 2026.10.14 දින දක්වා |

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
වැලිගම නගර සභාව,
2026.07.17